**ශීර්ෂය 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව**
**-------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020ජූලි 03දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 03දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරවපිළියෙළ කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනටජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම
-----------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීම කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සොයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මකසාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම්හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන් වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධතා හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත් පහත සඳහන් පරිදි එම අවශ්‍යතාවයන්ගෙන් බැහැරව කටයුතු කර තිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| උක්ත චක්‍රලේඛයෙහි 4.2 ඡේදය අනුව මූල්‍ය නිලධාරී හෝ ප්‍රධාන ගණකාධිකාරී විසින් ඒසීඒ-06 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය අත්සන් කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ ලද ආකෘති පත්‍ර අනුව සකස් කරන ලද බවත් එහි මුළු එකතුව සඳහන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය ප්‍රධාන ගණකාධිකාරී, ගණන්දීමේ නිලධාරි හා ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අත්සනින් යුතුව ඉදිරිපත් කර ඇති බව දන්වා ඇත. |

### 1.6.2. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

#### 1.6.2.1 අක් මුදල් ගැලපුම් ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විසින් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වැය විෂයයන් වෙනුවෙන් දරන ලද වියදම්වල එකතුව භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් හා ඒකාබද්ධ ශේෂ පිරික්සුම | මූල්‍ය ප්‍රකාශනනිවැරදි ව පිළියෙළ කළ යුතු වීම. | විගණනයෙන් පෙන්වා දුන් කරුණු පිළිගන්නා අතර ඒ අනුව අක් මුදල් ගැලපුම් ගිණුම නිවැරදි කර පිළියෙල කළ බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | අනුව රු.19,163,919 ක් වුවද අක් මුදල් ගැලැපුම් ගිණුමට රු.17,823,785 ක් ලෙස රු.1,340,134 ක් අඩුවෙන් ගැලැපුම් කර තිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ අනුව අත්තිකාරම් ගිණුමෙහි ලැබීම් ශේෂයන්හි වෙනස රු.1,663,301 ක් අක්මුදල් ගැලැපුම් ගිණුමෙහි බැරට ගැලැපිය යුතු වුවද භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ අනුව හරස් සටහන්වල එකතුව වූරු.4,093,758 ක් ගලපා තිබීම හේතුවෙන් රු.2,430,457 ක් වැඩියෙන් බැර කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙළ කළ යුතු වීම. | විගණනයෙන් පෙන්වා දුන් කරුණු පිළිගන්නා අතර ඒ අනුව අක් මුදල් ගැලැපුම් ගිණුම නිවැරදි කර පිළියෙල කළ බව දන්වා ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ අනුව අත්තිකාරම් ගිණුමෙහි ගෙවීම් ශේෂයන්හි වෙනස රු.244,955 ක් අක්මුදල් ගැලැපුම් ගිණුමෙහි බැරට ගැලැපිය යුතු වුවද භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ අනුව හරස් සටහන්වල එකතුව වූ රු. 3,326,118 ක් ගලපා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනනිවැරදි ව පිළියෙළ කළ යුතු වීම. | විගණනයෙන් පෙන්වා දුන් කරුණු පිළිගන්නා අතර ඒ අනුව අක් මුදල් ගැලැපුම් ගිණුම නිවැරදි කර පිළියෙල කළ බව දන්වා ඇත. |

**1.6.3 මූල්‍යතත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂය අවසානයේමූල්‍ය නොවන වත්කම් වටිනාකමරු.467,915,465 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී හඳුනා ගන්නා ලදමූල්‍යනොවන වත්කම් වටිනාකමආරම්භක ශේෂයට එකතු කිරීම හේතුවෙන් ආරම්භක ශේෂය රු.7,267,476,945 ක් ලෙස රු.6,799,561,480 ක් වැඩියෙන්දක්වා තිබුණද එම වෙනස පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | වෙනස්වීම්වලට හේතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලැපීම් කළ යුතුවීම. | වෙනස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබූ බව පිළිගනිමි.2018 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ගිණුම භාණ්ඩාගාර වෙබ් අඩවියට උත්පනය කර නොමැති වීමත් එය 2019 වර්ෂයේදී උත්පනය කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ මූලධන වත්කම් අත්පත් කර ගැනිම සඳහාරු.119,116,151 ක වියදමක් දරා තිබූ නමුත් ඒසීඒ-06 මූලා නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය තුළ වසරේ අත්පත් කර ගැනීම් ලෙස රු.75,204,957 ක් ගිණුම් ගත කර තිබුණි. ඒ අනුව වෙනස රු. 43,911,194 ක් විය. | වෙනස්වීම්වලට හේතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලපීම් කළ යුතුවීම. | මෙය ගිණුම්ගත කර නොමැති බව පිළිගනිමි. 2020 වර්ෂයේ පෙබරවාරි ගිණුම් සාරාංශයෙන් නිවැරදි කර ඇති බව දන්වා ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ඒසීඒ-06 මූලා නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ මගී වාහන අත්පත් කර ගැනීම සඳහා රු. 351,500 ක පිරිවැයක් දරා ඇති බව සඳහන් වුවද 322-02-01-0-2101 වැය විෂය යටතේ වාහන අත්පත් කර ගැනීම සඳහා කිසිදු වියදමක් දරා නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. | මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

### 1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව ගාස්තු,අධිභාර, දඩ මුදල්,බලපත්‍ර හා ආදායම් නොවන ලැබීම් ලෙස රු.725,467,086 ක් වුවද, ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව රු.747,695,833 ක් විය. ඒ අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.22,228,747 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වෙනස්වීම්වලට හේතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලපීම් කළ යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත්තේ මුදල්වලින් කරන ලැබූ ගනුදෙනු සැලකිල්ලට ගෙන වන අතර හරස් සටහන් එහිදී නොසලකා හරින ලදි. විගණනයෙන් මෙය නිවැරදි කරන ලෙස දන්වන ලද බැවින් 2020 ගිණුම ඒ අනුව සකස් කරන බව දන්වා ඇත. |
| (ආ) | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව සමාලෝචිත වර්ෂයේ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම රු.19,163,919 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එයරු.14,523,640 ක් ලෙස සටහන් කර තිබුණි. ඒ අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලදරු.4,640,279 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වෙනස්වීම්වලට හේතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලපීම් කළ යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත්තේ මුදල්වලින් කරනු ලැබූ ගනුදෙනු සැලකිල්ලට ගෙන වන අතර හරස් සටහන් එහිදී නොසලකා හරින ලදි. 2020 ගිණුම ඒ අනුව සකස් කරන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ අත්තිකාරම් අය කර ගැනීම් රු.1,081,250 ක් වුවද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එය රු.28,550,677 ක් විය. තවද අත්තිකාරම් ගෙවීම් රු.32,988,531 ක් වුවද,ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එය රු.36,080,995 ක් විය. ඒ අනුව ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.24,376,963 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | වෙනස්වීම්වලට හේතු හදුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලපීම් කළ යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත්තේ මුදල්වලින් කරන ලැබූ ගනුදෙනු සැලකිල්ලට ගෙන වන අතර හරස් සටහනින් එහිදී නොසලකා හරින ලදි. 2020 ගිණුම ඒ අනුව සකස් කරනු ලබන බව දන්වා ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ තැන්පතු ලැබීම් රු.55,209,601 ක් වුවද, ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එය රු.269,825,491 ක් වශයෙන්ද තැන්පතු ගෙවීම් රු.89,058,322 ක් වුවද,ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එය රු.296,940,312 ක් වශයෙන්ද දක්වා තිබුණි. එම හේතුවෙන් මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.6,733,900 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | තැන්පතුලැබීම් හා ගෙවීම් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ නිවැරදිව දැක්වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත්තේ මුදල්වලින් කරන ලැබූ ගනුදෙනු සැලකිල්ලට ගෙන වන අතර හරස් සටහනින් එහිදී නොසලකා හරින ලදි. 2020 ගිණුම ඒ අනුව සකස් කරනු ලබන බව දන්වා ඇත. |

### 1.6.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය අනුව එකතුව රු.63,324,055 ක් වූ මගී වාහන හා විසිතුරු උද්‍යාන අපහරණයට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙහි මගී වාහන අපහරණ වටිනාකම ලෙස සටහන් කර ඇත්තේ 2015 වර්ෂයේ සිට වත්කම් ගිණුම්ගත කිරීමේදී සාවද්‍ය ලෙස ගිණුම් ගත කරන ලද අගයන් නිවැරදි කිරීමට වන අතර විසිතුරු උද්‍යාන අපහරණය ලෙස සටහන් කර ඇත්තේ 2105 වැය විෂය යටතේ අදාළ උද්‍යානවල විවිධ පොදු කාර්යය කටයුතු සඳහා දරන ලද වියදම් වේ. මෙය භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි සිදු කරන ලද බව දන්වා ඇත. |

## 1.6.6 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්පහත සඳහන් පරිදි ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.8 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නැත. |

## 1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6.1 වගන්තිය | නිලධාරීන් 09 දෙනෙකු වර්ෂ 05 ඉක්මවා, වර්ෂ 03 සිට වර්ෂ 19 දක්වා කාලයක් රජයේ නිවාසවල අඛණ්ඩව පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය. | ආයතන සංග්‍රහයේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙවන් දිර්ඝ කාලීන පදිංචිකරුවන්ට වසර 03 ක සහන කාලයක් ලබාදී උද්‍යානයේ කටයුතුවලට බාධා නොවන පරිදි නිල නිවාසවලින් ඉවත්විය යුතු බව දන්වා යැවීමටත් ඉදිරියේදී වෙනත් ඉල්ලුම්කරුවන්ට එම අවස්ථාව ලබාදීමට කටයුතු කරනු ලබන බවත් දන්වා ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිසම් සභාව විසින්2009 පෙබරවාරි 20 වැනි දින නිකුත් කරන ලද අංක 1589/30 දරන අති | වසර 05 කට වැඩි කාලයක් නිලධාරීන් සහ සේවකයින් 34 දෙනෙකු එකම ස්ථානයක සේවය කර තිබුණි. | කාර්යය පරිපාටික රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඒකාබද්ධ සේවාවන්ට අයත් සේවකයින්ගේ ස්ථාන මාරුකිරීමේ වගකීමරාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් සතුවේ. කෘෂිකර්ම උපදේශක, ගාස්තු අයකිරීමේ සහකාර හා උද්‍යාන සුළු පරිපාලක යන තනතුරුවල සිටින |

| | | | | |
|---|---|---|---|---|
| | විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්යය පරිපාටික රීති 01 වැනි බාණ්ඩයේ XVIII වන පරිච්ඡේදයේ 202 රීතියේ විධිවිධාන | | | නිලධාරීන් අනිවාර්ය ස්ථාන මාරුකිරීමට මෙම දෙපාර්තමේන්තුවේ ඒකක පිහිටා තිබෙන අන්දම නිසාත්රජකාරී ස්වභාවය නිසාත් ප්‍රායෝගිකව දුෂ්කරය. ස්ථාන මාරුවීම් සඳහා සේවයේ අවශ්‍යතාවය මත හා ඕනෑම අවස්ථාවක කරන ඉල්ලීම් සලකා බලා ඒ අනුව කටයුතු කරනු ලබන බව දන්වා ඇත. |
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 2/2018 දරන රාජ්‍ය පරිපාලන ලේකම්ගේ චක්‍රලේඛය | දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ ප්‍රාථමික ශ්‍රේණිවල සේවකයින් සඳහා දිනක පුහුණු වීමක් ලබා දී තිබුණද චක්‍රලේඛය ප්‍රකාරව පැය 12 ක පුහුණු කාලය ආවරණය වී නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | එක් සේවකයෙකුට පැය 12 ක පුහුණුවක් ලබාදීම 500 කට ආසන්න කම්කරුවන් විෂයෙහි දුෂ්කර කාර්යයක් වේ. ආසන්න වශයෙන් දින 02 ක් සේවයෙන් බැහැර කර කම්කරු පුහුණු වැඩසටහන් පැවැත්වීම මූල්‍යමය ලෙස මෙන්ම ප්‍රායෝගිකවද ගැටළු සහිතවේ. එසේ වුවත් 2020 වසරේදී එක් දින පුහුණු වැඩසටහන් සිදු කිරීමට සටහන් කර ගත් බව දන්වා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 අග්‍රිම කළමනාකරණය

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ක්‍රියාකාරකම් ඵලදායීව පාලනය කර ගැනීම සඳහා මාසිකව දෙපාර්තමේන්තුවට අවශ්‍ය අත් මුදල් ප්‍රමාණය පිළිබඳ සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවට අවශ්‍ය අත් මුදල් ප්‍රමාණය සැලැසුම් කළ යුතු වීම. | දෙපාර්තමේන්තුව විසින් රැස් කරනු ලබන ආදායම වියදම් සඳහා යොදා ගනු ලබන බැවින් වාර්ෂිකව අත් මුදල් අවශ්‍යතාවය සැලැසුම් කර ඒ අනුව කටයුතු කරනු ලබන බව දන්වා ඇත. |

**2.2** **ආදායම් කළමනාකරණය**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම රු.1,000,000,000 ක් වුවද රැස් කරනලදආදායම රු.713,347,445 ක් විය. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමට වඩා රු.286,652,555 ක් එනම් සියයට29 ක් අඩුවෙන් උපයා තිබුණි. | මුදල් රෙගුලාසි 85(1)(ඇ) හා 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරනරාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව ආදායම් වඩාත් කාර්යක්ෂමව පුරෝකථනය කළ යුතු වීම. | පූර්වවර්ෂවල අගෝස්තු, සැප්තැම්බර් හා දෙසැම්බර් මාස වල විදේශිය හා දේශීය සංචාරකයින්ගේ පැමිණීම අපේක්ෂා කර මෙම ඇස්තමේන්තු සංශෝධනය කළ නමුත් 2019 වර්ෂයේ සංචාරකයින්ගේ පැමිණීම අඩුවීම මෙයට හේතු වී ඇති බව දන්වා ඇත. |
| (ආ) ජාතික උද්භි දඋද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේකැෆටේරියා ආපනශාලාව හා උද්‍යානය ඉදිරිපස කිරිහල බදු පදනම මත ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා බාහිර පාර්ශවයන්ට ලබා දීමේදී අය විය යුතු රු.11,461,465 ක හිඟබදු මුදල් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම් ප්‍රකාශයේ සටහන් කර නොතිබුණි. | හිඟ ආදායම් හෙළිදරව් කළ යුතු වීම. | තවද 2019 නොවැම්බර් 1 සිට 30 දක්වා කිරි හල අලුත්වැඩියා කටයුතු සඳහා වසා දැම්ම හේතුවෙන් අදාළ ආයතනය වෙත සහන කාලයක් ලබාදීමට කටයුතු කර ඇති නිසා මෙම හිඟ ආදයම්, හිඟ ආදායම් ප්‍රකාශයට ඇතුළත් නොකළ බවත්, ප්‍රමාද දෝෂයක් හේතුවෙන් 2006 මැයි 01 සිට 2008 අප්‍රේල් 04 දක්වා කැෆටේරියා ආපන ශාලාවේ හිඟ බදු මුදල් හිඟ ආදායම් ප්‍රකාශයේ දක්වා නොමැති බවත් දන්වා ඇත. |

**2.3** **වියදම් කළමනාකරණය**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| (අ) 2019 දෙසැම්බර් 04 දිනැති අංක 07/2019 සහ 2019 ජුනි 17 දිනැති අංක 04/2019 දරන අයවැය චක්‍රලේඛ ප්‍රකාරව විදුලිය,ජල පරිභෝජනය, දුරකතන සේවා හා | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේ වැඩිපුර වියදම් දැරීමට හේතුවූයේ සංයුක්ත දීමනාව සංශෝධනය වීම, නවක නිලධාරීන් බඳවා ගැනීම, |

| | | | |
|---|---|---|---|
| | මිලදී ගැනීම් මනා පාලනයකින් යුතුව පවත්වා ගැනීමට හැකිවන පරිදි නිර්ණායක සකස් කරක්‍රියාත්මක කිරීමට සියලුම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා ගණන් දීමේ නිලධාරීන් වගබලා ගත යුතු නමුත් අදාළ වැය විෂයන්හි ඉකුත් වර්ෂයේ වියදමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.5,175,038 ක් එනම් සියයට 38 ක් වැඩිපුර වියදම් දරා තිබුණි. | | වෙළඳපල මිල ගණන් හා බදු අනුපාත ඉහළ නැංවීමනිසා බිල්පත් අගය ඉහළ යාම සිදු වී ඇති බව දන්වා ඇත. |
| (ආ) | වැය විෂයයන් 02 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනය වූ රු.109,800,000 න් රු.6,610,000 ක් එනම් සියයට 6 ක් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | විදේශ සංචාර තාවකාලිකව අත්හිටුවීම, සංයුක්ත දීමනාව සංශෝධනය වීම මීගලුව හරිත පියස පුහුණු මධ්‍යස්ථානයේ නව ගොඩනැගිල්ලක් ඉදිනොකිරීම යනාදී හේතු මත මාරුකර ඇති බව දන්වා ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 14 ක් සඳහා සපයා තිබුණු රු.416,450,000කමූලික ප්‍රතිපාදනයට අමතරව මුදල් රෙගුලාසි 66 මාරු කිරීම මඟින් හා පරිපූරක ඇස්තමේන්තු මඟින් පිළිවෙළින් රු.6,610,000 ක් හා රු.73,360,000 ක් වශයෙන් රු.79,970,000 ක් ලබා ගෙන තිබුණි. ඒ අනුව සමස්ත ඇස්තමේන්තුව එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50හා 2019 අප්‍රේල් 08 දිනැති අංක 03/2019 දරන අයවැය චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙයට හේතුව නවක නිළධාරීන් බඳවා ගැනීම, උද්භිද උද්‍යාන පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 දක්වා විවෘතව තැබීම මත අතිකාල හා අනෙකුත් අවශ්‍යතා ඉහළ යාම, වෙළඳපල මිල ගණන් ඉහළ යාම වැනි කරුණු බව දන්වා ඇත. |
| (ඈ) | ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 3/2019 හා2019 අප්‍රේල් 08 දිනැති සහ අංක 5/2019 හා2019 සැප්තැම්බර් 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව මූලධන ප්‍රතිපාදනවලින් අනිවාර්යයෙන් සියයට 25 ක් ඉතිරි කර ගත යුතු වුවද වැය විෂයන් 10 ක රු.431,700,000 ක් වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් රු.396,197,183 ක් වැයකර සියයට 08 ක් පමණක් ඉතිරි කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් සියයට 10 ක් අවුරා තබන ලදි. නමුත් 2019 සැප්තැම්බර් 24 දිනැති 5/2019 ජාතික අයවැය චක්‍රලේඛය නිකුත් කරන විට ගිවිසුම්ගතව වැඩ ආරම්භ කර තිබූ අත්‍යවශ්‍ය ව්‍යාපෘති එකී චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව කටයුතු කරන බව දන්වා ඇත. |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | විශ්‍රාම ගිය,මියගිය, සේවය හැරගිය හා වැඩ තහනම් කළ නිලධාරීන් 8 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.211,493 ක් වූ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව ලබාදුන් ණය නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | හිග සේවක ණය අයකිරීමට හෝ අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ආ) | සිදු කරන ලද නියැදි පරීක්ෂණය අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සහකේවල ණය ලේඛනයන්ගේ අවසන් ණය ශේෂ අතර අවස්ථා14 කදී රු.251,516 ක වෙනස්කම් පැවතුණි. | වෙනස්වීම්වලට හේතු හඳුනාගෙන නිවැරදිව ගැලැපීම් කළ යුතුවීම. | කාර්තුවලට අදාළ කේවල ණය ශේෂ ගණනය කිරීමේදී, ඉදිරියට ගෙන ඒමේදී සහ වැරදියට ගණනය කිරීම යනාදී කරුණු හේතුවෙන් වෙනස සිදු වී ඇති බව දන්වා ඇත. |

## 2.5 තැන්පතු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් කර වසර 02 ඉක්මවා ඇති එකතුව රු.467,000 ක් වූ තැන්පතු ශේෂ 3 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකළ යුතු වීම. | 2020 වර්ෂයේ ඇස්තමේන්තු සකස් කර ඉටු කළ යුතු ඉතිරි කටයුතු සඳහා රු.429,859 මුදලක් රඳවාගෙන ඇති බවත් අනෙකුත් තැන්පතු සම්බන්ධයෙන් අදාළ ආයතන වෙත දැනුවත් කර ඇති බවත් දන්වා ඇත. |

## 2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිකුත් කර මාස 06 ඉක්මවා ඇති නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ වටිනාකම රු.74,193 ක් වූ චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කරනු ලබන බව දන්වා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ඉකුත් වර්ෂයේ මැයි මස ගම්පහ උද්භිද උද්‍යානයේ සෝලා විදුලි පද්ධතිය රු.2,475,200 ක පිරිවැයක් දරා ස්ථාපිත කර තිබුණද මෙමඟින් මාසිකව කිලෝවොට් 2400 ක් නිපදවන බව අදාළ ආයතන විසින් දන්වා තිබුණි. එහෙත් මෙම පද්ධතිය මඟින් මාසිකව කිලෝවොට් 677 ක් (350-1000) එනම් සියයට 28 ක් පමණක් සපයා තිබුණි. | ප්‍රමාණවත් පරිදි විදුලිය උත්පාදනය නොවීමට හේතු මොනවාද යන්න සොයා බලා ඊට අදාළ පිළිසකර කර ගැනීම් කළ යුතුවීම. | මෙමඟින් බලාපොරොත්තු වූ විදුලි ඒකක ප්‍රමාණය සියයට 100 ලබා ගැනීමට නොහැකි වුවද සෑම මාසයකම සැලකිය යුතු විදුලි ඒකක ප්‍රමාණයක් උත්පාදනය කරනු ලබන බව දන්වා ඇත. |
| (ආ) ගම්පහ උද්භිද උද්‍යානයට පැමිණෙන නරඹන්නන්ගේ ආශ්වාදය වැඩි කිරීමේ අරමුණින් රු.23,760,000 ක ඇස්තමේන්තු පිරිවැයක් මත ඉදිකරන ලද ඕකිඩ් ගෘහයේ වර්ධිත අවධියේ පැළ 572 ක් පැවති අතර ඉන් පැළ 50 ක පමණක් මල් හටගෙන තිබීම හේතුවෙන් ඕකිඩ් ගෘහයේ දැකුම්කළු බව අවම වී තිබුණි. | අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම තත්ත්වය මග හැරීම සඳහා තායිලන්තයෙන් ආනයනය කරන ලද ඕකීඩ් පැළ 2000 ක් පමණ ලබාදී ඇති බවත් ඕකීඩ් ගෘහය දැකුම්කළු ලෙස පවත්වා ගෙන යාමටඅවශ්‍ය උපදෙස් ලබාදී ඇති බවත් දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය යටතේ ඇති අධ්‍යාපන මධ්‍යස්ථානය මඟින් NVQ 3 සහ 4උද්‍යාන අලංකරණ ශිල්පී පාඨමාලාවේ පසුගිය වසර 05 තුළ අයදුම්පත් ලැබුණු ප්‍රමාණයෙන් ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 09 ත් 19 ත් අතර ඉතා අඩු මට්ටමක පැවති අතර ලියාපදිංචි ශිෂ්‍යයින්ට සාපේක්ෂව පාඨමාලාව සම්පූර්ණ නොකළ සිසුන් සංඛ්‍යාව සියයට 22 සිට සියයට 64 දක්වා පරාසයක පැවතුණි. | ශිෂ්‍යයින් දැනුවත් කර පාඨමාලාවන් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කළ යුතු වීම. | NVQ 4 පාඨමාලවට සිසුන් අයදුම් කිරීමත් සම්මුඛ පරීක්ෂණයට පැමිණීමත් ලියාපදිංචි වීමත් හා පාඨමාලාව හැර නොගොස් සම්පූර්ණ කිරීම අපගේ පාලනයෙන් තොර ක්‍රියාවන් බව දන්වා ඇත. |
| (ඈ) | පේරාදෙණිය උද්භිද උද්‍යානයේ අධ්‍යයන මධ්‍යස්ථානය මඟින් මල් වගාව හා උද්‍යාන අලංකරණයට අදාළ NVQ 5, 6 පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | පාඨමාලා ආරම්භ කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. | අදහස් දක්වා නැත. |
| (ඉ) | ගම්පහ උද්භිද උද්‍යානයේ යකඩ ග්‍රිල් හා කොන්ක්‍රීට් රාමුව සහිත ආරක්ෂක බැම්ම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් 2019 ජූලි 09 දින රු.1,967,490 කට පිරිනමා තිබුණි. මෙහි අත්තනගලු ඔයට මායිම්ව අඩි 50 ක පමණ ප්‍රමාණයක් ඉතිරි කර පැති බැම්ම ඉදි කර තිබීමේ හේතුවෙන් අපේක්ෂිත ආරක්ෂාව ලැබී නොතිබුණි. | ඇස්තමේන්තු නිවැරදි පිරිවිතරයන්ට අනුකූලව අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා පිළියෙළ කළ යුතු වීම. | 2019 වර්ෂය සඳහා වෙන්වූ ප්‍රතිපාදන සීමාව තුළ උද්‍යානයේ යකඩ ග්‍රිල් හා කොන්ක්‍රීට් රාමුව සහිත ආරක්ෂකබැම්මේ කොටසක් ඉදිකර ඇති අතර, ඉතිරි කොටසේ වැඩ නිම කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 2020 අයවැය ඇස්තමේන්තුවට ඇතුළත් කර ඇති බව දන්වා ඇත. |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද වටිනාකම රු.97,707,888 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 22 ක ඉදිකිරීම් කටයුතු දින 21 සිට දින 95 ක් දක්වා වූ කාල පමාවකින් පසුව නිමකර තිබුණි. | ඉදිකිරීම් කටයුතු නියමිත කාලය තුළ නිම කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

**3.3 කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද වටිනාකම රු.34,249,721 ක් වූ ව්‍යාපෘති 04 ක ඉදිකිරීම් කටයුතු නියමිත දිනට දින 17 ත් දින 36 ත් අතර කාල පමාවකින් පසුව ආරම්භ කර තිබුණි. | ඉදිකිරීම් කටයුතු නියමිත කාලය තුළ ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

**3.4 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පේරාදෙණිය උද්භිද උද්‍යානයේ ප්‍රධාන ගේට්ටුව අසල කිරිහල බදු දීමසඳහා ලංසු කැඳවීමේදී පසුගිය වසර 5 ක විගණනය කරන ලද මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන ලෙස කොන්දේසියක් ඇතුළත් කර තිබීමෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 මාර්ගෝපදේශයේ නියමයන්ගෙන් බැහැර වී තිබුණි. තවද ලංසු ඉල්ලා අස් කර ගෙන තිබූ ඉහළ වටිනාකමකට ලංසු ඉදිරිපත් කළ පළමු හා දෙවන ලංසුකරුවන්ගේ 5.3.11(ආ) මාර්ගෝපදේශය අනුව අය කරගත යුතු රු.400,000 ක ලංසු සුරක්ෂණයක් 2020 ජනවාරි 31 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නැත. |
| (ආ) පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ පර්ගෝලාව අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තු වටිනාකමෙන් සියයට 61.5 ක් නියෝජනය කරන අයිතම අංක 07 හි ඇස්තමේන්තු වටිනාකම රු.544,300 ක් වුවද එය රු.371,250 කට ඉටු කිරීමට කොන්ත්‍රාත්කරු විසින් ලංසු ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතු වීම. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7:9:11 (අ) අනුව කටයුතු නොකළ බවත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ (NERDS) 2018 |

| | | | |
|---|---|---|---|
| | 7.9.11(අ) මාර්ගෝපදේශයේ නියමයන් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද අයිතම අංක 5 හා 7 සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 මාර්ගෝපදේශය අනුව කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවලට අනුකූල බවට ප්‍රධාන ඉංජිනේරුවරයා විසින් සහතික කරමින් රු.944,100 ක් ගෙවා තිබුණද, ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ (NERDS)තාක්ෂණයට අනුකූලද යන්න පිළිබඳ ප්‍රමිති සහතිකයක් ගෙවීම් කිරීමට ප්‍රථම ලබාගෙන නොතිබුණි. | | අප්‍රේල් 20 දිනැති ලිපිය හා තත්ත්ව වාර්තාව අනුව මෙමකොන්ක්‍රීට් බීම් ප්‍රමිතියෙන් තොර බව දන්වා ඇත. ඒ අනුව අවසන් බිල්පත් ගෙවීම් සිදුකර නොමැති බව දන්වා ඇත. |
| (ඈ) | සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ වනය පිහිටි කොටසේ චේන් ලින්ක් වැටක් ඉදිකිරීම සඳහා අවම ලංසු ඉදිරිපත් කර තිබූ කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකුගෙන් කිසිදු කරුණු විමසීමකින් තොරව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2 මාර්ගෝපදේශයේ නියමයන්ගෙන් බැහැරව තාක්ෂණික ඇගැයීම් කමිටු නිර්දේශයන්ද නොසලකාරු.4,053,000ක ලංසුවක් ඉදිරිපත් කළ 6 වෙනි ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනැමීම හේතුවෙන් රු.1,158,400 ක මූල්‍ය අලාභයක් සිදු වී තිබුණි. තවද 7.9.11(ඇ) මාර්ගෝපදේශය අනුව ඉහළ කාර්යසාධන සුරක්ෂණයක් නොලබා කොන්ත්‍රාත් වටිනාකමේ සියයට 5 ක එනම් රු.202,650 ක සුරක්ෂණයක් ලබාගෙන තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නැත. |
| (ඈ) | සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ ගරාජය වැඩි දියුණු කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2(ක) මාර්ගෝපදේශයේ නියමයන්ගෙන් බැහැරව රු.2,899,630 ක් වූ අවම ලංසු ප්‍රතික්ෂේප කර 2019 මැයි 06 වන දින රු.2,982,415 කට ලංසු ප්‍රදානය කර තිබුණි. ඒ අනුව රු.86,785 ක මූල්‍යමය අලාභයක් සිදුව තිබුණි. තවද 7.10 මාර්ගෝපදේශය අනුව අවම ලංසුකරුගේ පශ්චාත් සුදුසුකම් පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්අනුව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 (ආ) මාර්ගෝපදේශය අනුව අවිස්සාවේල්ල උද්භිද උද්‍යානයේ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2019 අප්‍රේල් 29 දින ප්‍රදානය කර තිබූ රු.25,682,196 ක් වටිනා කොන්ත්‍රාත්තුවට අදාළව ඉදිරිපත් කර ඇති වටිනාකම රු.1,284,110 ක් වූ කාර්යසාධන සුරක්ෂණයේ වලංගු කාලය කොන්ත්‍රාත්තුව නිම කිරීමට අපේක්ෂිත දිනයෙන් පසුව දින 28 ක් දක්වා වලංගු වන පරිදි ලබා ගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමන් අනුව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නැත. |
| (ඊ) | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) මඟින් ඉදිරිපත් කර ඇති ප්‍රමිති ලංසු ලේඛන ප්‍රසම්පාදන කටයුතු සඳහා භාවිතා කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ඉදිකිරීම්වලට අදාළව කොන්ත්‍රාත් ගිවිසුම් පත්‍රය, ප්‍රතිග්‍රාහක ලිපිය සඳහා ප්‍රමිති ලංසු ලේඛන භාවිතා කර නොතිබුණි. | ප්‍රමිති ලංසු ලේඛන ප්‍රසම්පාදන කටයුතු සඳහා භාවිතා කළ යුතු වීම. | අදහස් දක්වා නැත. |
| (උ) | දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ සිදු කරන ලද සුළු හා මහා පරිමාණ කොන්ත්‍රාත්වලට අදාළව ප්‍රමිති ලංසු ලේඛනවල දක්වා ඇති කොන්ත්‍රාත්තුවට අදාළ කොන්දේසි ලංසු ලේඛනවල ඇතුළත් කළයුතු වුවද, එසේ සිදු කර නොතිබුණි. | කොන්ත්‍රාත් කොන්දේසි ලංසු ලේඛනවල ඇතුළත් කළ යුතු වීම. | අදහස් දක්වා නැත. |
| (ඌ) | පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ CCTVකැමරා පද්ධතියක් සවි කිරීම සඳහා රු.7,200,000 ක ප්‍රතිපාදනයක් වෙන් කර තිබුණද 2018 ඔක්තෝම්බර් 19 වන දින රු.16,645,373 ක වටිනාකමකට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 මාර්ගෝපදේශය අනුව මේ සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙළ කර නොතිබුණු අතර මෙය 2019 සැප්තැම්බර් 09 වන දින නිමකර තිබුණද කාර්යසාධන සුරක්ෂණය ඒ අනුව දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 මාර්ගෝපදේශය අනුව වැඩ අවසන් කිරීමේ සහතිකයක් ඉදිරිපත් කර නොතිබුණි. මේ සඳහා අය කළ යුතු ප්‍රමාද ගාස්තු මුදල වූ රු.1,664,537 ක් අය කරගෙන නොතිබුණු අතර ඉදිකිරීමට අදාළ වගකීම් සේවා කාලයකට ගිවිසුම්ගත වී නොතිබුණි. මේ සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදනය ඉක්මවා රු.11,630,310 ක මුදලක් ගෙවා තිබුණි. | නියමිත ප්‍රතිපාදන සීමාවන් තුළ කටයුතු කිරීම සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ප්‍රතිපාදන ඉක්මවීමක් සිදු වී ඇති බවත් ඒය දෙපාර්තමේන්තුවේ ඉතිරිවන ප්‍රතිපාදනවලින් කළමනාකරණය කරන ලද බවත්, කාර්යසාධන සුරක්ෂණය දින දීර්ඝ කිරීම නොකළ බවත් ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කර ඇති බවත් වැඩ අවසන් කිරීමේ සහතිකයක් ඉදිරිපත් කර ඇති බවත් දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (එ) | ප්‍රතිග්‍රහණ ලිපි ප්‍රකාරව ලංසුකරු විසින් කොන්ත්‍රාත්තුව පිළිගනු ලැබ, දින 14 ක් ඇතුළත ගිවිසුමට එළඹිය යුතු වුවද, ක්‍රියාත්මක කරන ලද වටිනාකම රු.60,085,527 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 19 ක ගිවිසුම් අත්සන් කිරිම ප්‍රතිග්‍රහණ ලිපිවල සඳහන් දිනයන්ට වඩා දින 17 ත් දින 87 ත් අතර කාල පමාවකින් පසුව සිදු කර තිබුණි. | නියමිත කාලය තුළ ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඒ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) මාර්ගෝපදේශය අනුව කොන්ත්‍රාත්කරු සමග විධිමත් ගිවිසුමකට එළඹිය යුතු නමුත් වටිනාකම රු.11,080,368 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 13 ක් කොන්ත්‍රාත් කටයුතු ආරම්භ කර දින 08 ත් දින 77 අතර කාලයකින් පසුගිවිසුම්වලට එළඹ තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඔ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 මාර්ගෝපදේශය අනුව කටයුතු නොකර දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත් වටිනාකම රු. 14,407,402 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 16 ක ලංසු සුරක්ෂණයේ වලංගු කාලය, කොන්ත්‍රාත්තු ගිවිස ගැනිමේ දිනට වඩා දින 04 සිට දින 60 ක් දක්වා වූ වැඩිපුර කාලයක් සඳහා වලංගුවන ලෙස ලබා ගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

## 3.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තාවේ ඇතුළත් අනුකූලතා වාර්තාවේ 8.3, 10.3, 12.3,13.1,14.2,17.3,19.1, 19.2 සහ 19.3 යන කරුණුවලට අනුකූල වී නොතිබුණි. | නිවැරදි තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

## 3.6 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යානයට අයත් මුළුභූමි ප්‍රමාණය අක්කර 149, පර්චස් 38 ක් වන අතර මෙයින් අක්කර ¾ ක වපසරියක ඇති අංක 1092 දරන නිල නිවාසය හා පර්චස් 24 ක වපසරියක ඇති අංක 1092/A දරන ගොඩනැගිල්ල කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් භුක්ති විඳින අතර 1971 අංක 07 දරන හා 1974 අංක 40 දරන පනත්වලින් සංශෝධිත 1969 අංක 07 දරන රජයේ නිවාස (සන්තකය පවරා ගැනීම) පනත යටතේ ආපසු පවරා ගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුව භුක්ති විඳින සියලුම ඉඩම් නිරවුල් කර අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | අන්‍යෝන්‍ය වශයෙන් සහයෝගී දෙපාර්තමේන්තු 02 ක් නිසා මේ පිළිබඳව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත මෙන්ම කෘෂිකර්ම ලේකම් වෙතද ලිඛිතව අවසන් නිවේදන යවා ඇත. ඉදිරියේදී නීත්‍යානුකූලව පවරා ගැනීම සඳහා කටයුතු කරන බව දන්වා ඇත. |
| (ආ) | ගනේවත්ත වන ඖෂධඋද්‍යානය තුළ දේශන, පුහුණු වැඩ සටහන් හා වැඩමුළු පැවැත්වීමේ අරමුණින් 2017 වර්ෂයේ රු.23,392,342 ක පිරිවැයක් දරා දෙමහල් දේශන ශාලා ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි.2017 වර්ෂයේ සිට 2019 සැප්තැම්බර් 19 දක්වා කාලය තුළ දේශන 59 ක් පවත්වා තිබූ අතර බාහිර පාර්ශ්වයන්ට කුලියට දීමෙන් රු.24,250 ක ආදායමක් පමණක් උපයා තිබුණි.ඒ අනුව විශාල පිරිවැයක් දරා ඉදිකරන ලද ගොඩනැගිල්ල ඌන උපයෝජිතව පැවතුණි. | දෙපාර්තමේන්තුව සතු වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2019 වර්ෂයේ ඔක්තෝබර් මාසය වන විට පුහුණු පන්ති 16 ක් සිදු කර ඇත. වසර අවසන්වන විට පුහුණු පන්ති 25 ක් සිදු කිරිමට අපේක්ෂා කරමි. තවද මහජනයාට මෙම උද්‍යානයෙන් ලබා ගත හැකි සේවාවන් පිළිබඳ දැනුවත් වීම තුළින් පවත්වන පුහුණු පංති සංඛ්‍යාව වැඩිකර ගැනීමට ඉලක්ක කර ඇති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගම්පහ උද්භිද උද්‍යානය සතු ටාටා ඩබල් කැබ් රථය 2018 අගෝස්තු මස සිට ගර්හිත තත්වයේ පැවති අතර එය විධිමත්ව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන විධිමත්ව අපහරණය කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙම රථය අළුත්වැඩියා කිරීම ආර්ථිකව අවාසිදායක වන බව නිගමනය කළ බැවින් තාක්ෂණික ආයතනයක් වෙත ලබාදීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. |
| (ඇ) | ගම්පහ උද්භිද උද්‍යානයේ මිරකල් උද්‍යානයේ සිටුවා ඇති මල්පැළ සඳහා නියමිත පරිදි ජලය ලබා දීමේ අරමුණින් 2017 නොවැම්බර් 03 දින මිලදී ගන්නා ලද රු.447,987 ක වටිනාකමකින් යුතු ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධතිය 2019 ජූලි 19 දින වන විටද එම උද්‍යානයේ සවි කිරීමට කටයුතු නොකර නිෂ්කාර්යව පැවතුණි. | අපේක්ෂිත අරමුණු ඉටකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව සතු වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගැනීමට කටයුතු කළ යුතු වීම. | ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධතියේ කොටසක් දැනටමත් භාවිතයට ගැනීම ආරම්භ කර ඇති අතර,එම කාර්යය ඉදිරියේදී සම්පූර්ණ කරන බව දන්වා ඇත. |
| (ඉ) | ගම්පහ උද්භිද උද්‍යානයේ මිරකල් උද්‍යානයේ අලංකාරය සඳහා 2017 ජූලි මස අඟල් 5 x 5 x 5 ප්‍රමාණයේ මල් පෝච්චි 30,000 ක් මිල දී ගෙන තිබුණු අතර මින් 5800 ක් පමණක් 2019 ජූලි 19 දින වන විට භාවිතා කර තිබූ අතර වටිනාකම රු.294,000 ක් වූ පෝච්චි 21000 ක් ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි. | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන මිලදී ගැනීම් සිදුකළ යුතු වීම. | මිරකල් පද්ධතිය සඳහා යොදවා ඇති පෝච්චිවල බොහෝ බඳුන් දිරාපත්ව ඇති බැවින් එම පෝච්චි ඉවත් කර නව පෝච්චි යෙදීමටත් අතිරික්ත බඳුන් පැළ තවානේ පැළ නිෂ්පාදනය සඳහා මිලදී ගත් බව දන්වා ඇත. |
| (ඊ) | අවශ්‍යතාවයන් නිසි පරිදි හඳුනා ගෙන මිලදී ගැනීම් සිදු නොකිරීම නිසා 2018 වර්ෂයේ ජූලි සහ අගෝස්තු මාසවලදී ගම්පහඋද්භිද උද්‍යානය විසින්පිළිවෙලින් රු.191,355ක් හා රු.261,603ක් වැයකර තීන්ත මිලදී ගෙන තිබුණු අතර ඉන් වටිනාකම රු.289,891 ක් වූ තීන්ත ලීටර 556 ක් 2019 ජූලි 17 වන විට ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි. | අවශ්‍යතාවයන් නිසි පරිදි හඳුනා ගෙන මිලදී ගැනීම් සිදු කළ යුතු වීම. | ගබඩාවේ ඇති තීන්ත වලින් බොහොමයක් දැනට භාවිතා කරමින් පවතින අතර,එම ද්‍රව්‍ය භාවිතා කිරීම ප්‍රමාද වී ඇත්තේ වසර පුරා පැවැති අයහපත් කාලගුණික තත්ත්වයන් හා ඒ පිළිබඳව නිසි පුහුණුවක් ඇති කම්කරුවන් හිඟවීම හේතුවෙන් බව දන්වා ඇත. |

**3.7** **පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය ඉදිරිපස කිරිහල පවත්වාගෙන යාම වෙනුවෙන් 2019 නොවැම්බර් 13 දින අත්සන් කළ බදු ගිවිසුම් අනුව 2019 නොවැම්බර් 18 දින සිට 2019 නොවැම්බර් 30 දින දක්වා දින 13 ක් වෙනුවෙන් අයකළ යුතු රු.178,533 ක මුදල 2019 ජනවාරි 31 දින වන විටද අය කර නොතිබුණි. | රජයට අයවිය යුතු ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නැත. |
| (ආ) | ගම්පහ උද්භිද උද්‍යානයේ නිලධාරිනියක් විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය මඟින් පවත්වනු ලබන කෘෂිකර්ම තාක්ෂණ හා කළමනාකරණ උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා වැටුප් සහිත නිවාඩු ලබාගෙන තිබුණි. එම පාඨමාලාව නිම කර නොතිබීම මත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XV වන පරිච්ඡේදයේ 4.7 ඡේදයේ නියමයන් ප්‍රකාරව අයකර ගත යුතු රු.1,051,390 ක මුදල අය කර ගැනීමට 2019 ජූලි 19 දින වන විටද කටයුතු කර නොතිබුණි. | රජයට සිදු වූ අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අදාළ පාඨමාලාව සඳහා රජය විසින් දරණ ලද මුදල කඩිනමින් ඇය වෙතින් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |

**3.8** **විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

| විගණන විමසුම පිළිබඳ විස්තරය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 4 කට 2020 මැයි 30 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.3,361,828 ක් විය. | විගණන විමසුම්වලට අදාළ කාලය තුළ පිළිතුරු ලබා දීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

## 3.9 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2006 මාර්තු 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 2006 නොවැම්බර් 10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සඳහන් කාර්යයන් අනුව නව උද්භිද උද්‍යාන ශ්‍රී ලංකාවේ සුදුසු ප්‍රදේශයක පිහිටු විය හැකි වුවද, උතුරු, උතුරු මැද හා නැඟෙනහිර පළාත් ආවරණය වන පරිදි ජාතික උද්භිද උද්‍යානයක් පිහිටු වීමට කළමනාකරණයේ අවධානය යොමු වී ඇති බවක් නිරීක්ෂණය නොවීය. | නව උද්භිද උද්‍යාන ශ්‍රී ලංකාවේ සුදුසු ප්‍රදේශයන්හි ආරම්භ කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. | උද්භිද උද්‍යාන ස්ථාපිත කිරීම සඳහා සුදුසු ස්ථාන ලබාදෙන ලෙස ඉල්ලමින් ඉල්ලීම් ලිපිඅදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යොමුකර ඇති බව දන්වා ඇත. |
| (ආ) | මහනුවර දිස්ත්‍රික්කයේ 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා සුවහස් මල් සංගම් ලියාපදිංචි වී නොතිබුණු අතර උතුරු, නැගෙනහිර පළාත්වල ලියාපදිංචි මල් සංගම් ගණන 07 ක් විය. | නව සුවහස් මල් සංගම් ලියාපදිංචිය වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. | සුවහස් මල් සමිත් පවත්වාගෙන යාම සඳහා ව්‍යවස්ථාවක් ඇති අතර,ඒ අනුව ගොවිජන සේවා බල ප්‍රදේශයකට සමිති 01 ක් පිහිටුවීමට නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. අළුතින් සුවහස් සමිති බිහි නොවුනද සමිතිවලට සාමාජිකයන් එකතුව වැඩිවී ඇති බව දන්වා ඇත. |
| (ඇ) | ගනේවත්ත වන ඖෂධ උද්‍යානය හෙක්ටයාර් 21 ක වපසරියකින් යුක්ත වන අතර මෙහි වටිනා ඖෂධ ශාක වර්ග 1000 කට ආසන්න ප්‍රමාණයක් පැවතියද වෘක්ෂලතා ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | සියලුම උද්‍යානයන්හි පවතින ශාක වර්ග හඳුනාගෙන වෘක්ෂලතා ලේඛනයක් පවත්වාගෙන යාම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. | ගනේවත්ත වන ඖෂධ උද්‍යානයට අනුයුක්තව සේවය කරන උද්‍යාන සංවර්ධන සහකාරවරිය විසින් මේ වන විට ජාතික ශාකාගාරයේ සහාය ඇතිව දැනට ශාක 600 ක් හඳුනාගෙන ඇති අතර,ඒවා ලේඛනයක ඇතුළත් කර ඇති බව දන්වා ඇත. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| වසර 2030 වන විට ඉටුකර ගත යුතු තිරසර සංවර්ධන ඉලක්කයන් සඳහා එක් එක් වසරේ ඉටුකර ගත හැකි ප්‍රමාණයන් පිළිබඳව සැලැසුමක් සකස් කර ඒ අනුව අදාළ ප්‍රතිපාදන වෙන් කර ගත යුතු අතර දෙපාර්තමේන්තුව විසින් එක් එක් වර්ෂය තුළ ඉටු කරගන්නා කාර්යයන් පිළිබඳව සැලසුම් සකස් කර නොතිබුණි. | එක් එක් වසරේ ඉටුකර ගත හැකි ප්‍රමාණයන් පිළිබඳව සැලැසුමක් සකස් කර ගත යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

## 5. යහපාලනය

### 5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂම් සභාව වෙත වාර්තා ඉදිරිපත් කරන බව අනුකූලතා වාර්තාව තුළ දක්වා තිබුණද, දෙපාර්තමේන්තුව විසින් අදාළ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | වාර්තා නියමිත පරිදි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

## 6. මානව සම්පත් කළමනාකරණය

### 6.1 අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 143 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ කටයුතු ක්‍රමවත්ව හා විධිමත්ව පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය වන පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නැත. |
| (ආ) | පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ බැටරි කාර් සඳහා අනුමත රියදුරු සංඛ්‍යාව 08 ම පුරප්පාඩුව පැවති අතර මොවුන් බඳවා ගැනීමේ කාර්ය පරිපාටිය විගණන දින වූ 2019 දෙසැම්බර් 17 දින වන විටත් අනුමත කරවා ගෙන නොතිබුණි. | බඳවා ගැනීමේ කාර්යපරිපාටි අනුමත කරවාගෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | බඳවා ගැනීමේ පරිපාටිය අනුමැතියට යවා ඇති බව දන්වා ඇත. |